# විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
## வெளிநாட்டு வளங்கள் திணைக்களம்
## Department of External Resources

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), තැ.පෙ. 277, කොළඹ 00100, ශ්‍රී ලංකාව
நிதி, பொருளாதார உறுதிப்படுத்துகை மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
செயலகம் (3 ஆம் மாடி), த. பெ. இல. 277, கொழும்பு 00100, இலங்கை
Ministry of Finance, Economic Stabilization and National Policies
The Secretariat (3rd Floor), P.O. Box 277, Colombo 00100, Sri Lanka

**Web Site**:www.erd.gov.lk **e-mail:** info@erd.gov.lk


**මාධ්‍ය නිවේදනය**

**පුනර්ජනනීය බලශක්තිය භාවිතයෙන් ශ්‍රී ලංකාවේ රෝහල්වල බලශක්ති සැපයුම ස්ථායීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජපන් රජය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) හරහා ලබාදෙන ජපන් යෙන් මිලියන එක්දහස් දෙසීය තිහක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 2.8 ක) ව්‍යාපෘති ආධාරය**

පිරිවැය අඩු කරන හා පිරිසිදු බලශක්ති අනාගතයක් පිළිබඳ බලාපොරොත්තු පුබුදුවාලන නවෝත්පාදනයක් වශයෙන් පුනර්ජනනීය බලශක්තිය සීග්‍රයෙන් වර්ධනය වේ. හරිතාගාර වායු විමෝචනයට දායක වෙමින් පරිසරයට අහිතකර බලපෑම් ඇති කරන හා වේගයෙන් ක්ෂය වෙමින් පවතින පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභවයන්, බලශක්ති අවශ්‍යතා තිරසාර ලෙස සපුරාලීම සඳහා විකල්ප පුනර්ජනනීය බලශක්ති සම්පත් පිළිබඳව සලකා බැලීමට ශ්‍රී ලංකා රජයේ අවධානය යොමු කරවා ඇත.

මෙම අභියෝගාත්මක ගමනට ශක්තියක් වෙමින්, ප්‍රධාන සංවර්ධන හවුල්කරුවෙකු ලෙස ජපන් රජය, සිය සහයෝගීතාව තවදුරටත් පුළුල් කරමින්, ශ්‍රී ලංකාවේ තෝරාගත් රෝහල්වල ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම සඳහා ජපන් යෙන් මිලියන එක්දහස් දෙසීය තිහක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 2.8 ක) ආධාරයක් ලබා දීමට එකඟ වී ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල, රත්නපුර ශික්ෂණ රෝහල සහ කුරුණෑගල ශික්ෂණ රෝහල යන තෝරාගත් රජයේ රෝහල් තුනක වහල මත ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය බලශක්ති උත්පාදන පද්ධති ස්ථාපනය කෙරේ. මීට අමතරව, ප්‍රකාශ වෝල්ටීයතා (Photovoltaic) මොඩියුල සහ උපාංග, බලශක්ති කන්ඩිෂනර් සහ උපාංග, විදුලි රැහැන් සහ සම්බන්ධිත පුවරු, ගිනි අනාවරක, වෙනත් ආශ්‍රිත ප්‍රතිසංස්කරණ සහ අදාළ සේවාවන් සපයනු ලැබේ. ශ්‍රී ලංකාවේ ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය බලශක්ති උත්පාදන ක්ෂේත්‍රයේ තාක්ෂණික හුවමාරුව සඳහා මෙම ප්‍රදාන සහයෝගීතාවය මහඟු අනුග්‍රහයක් වනු ඇත.

ඉහත ප්‍රදානයට අදාළ හුවමාරු පත්‍ර සහ ප්‍රදාන ගිවිසුමට අත්සන් තැබීම, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා විසින් 2024 පෙබරවාරි මස 14 වන දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී සිදු කරන ලදී. ජපාන රජය වෙනුවෙන් හුවමාරු පත්‍ර සඳහා අත්සන් තබන ලද්දේ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අතිගරු මිසුකොෂි හිදෙයකි මහතා වන අතර ප්‍රදාන ගිවිසුම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (ජයිකා) මූලස්ථාන ප්‍රධානී ටනාකා අකිහිකො මහතා විසින් අත්සන් තබන ලදී.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01
2024 පෙබරවාරි මස 14 දින


| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | 94-11-2484693 | කාර්යාලය / அலுவலகம் / Office | 94-11-2484500<br>94-11-2484600 | ෆැක්ස් අංකය / தொலை நகல் / Fax | 94-11-2447633<br>94-11-2387153<br>94-11-2434876 |